## සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

## 2025 වර්ෂය

## නාගරික සංවර්ධන අධිකාරිය

## ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

1. නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2025 වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන්, ප්‍රාදේශීය වශයෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරවා ගැනීම උදෙසා සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය විසින් දේශීය නිෂ්පාදකයින්, දේශීය සැපයුම්කරුවන්,කොන්ත්‍රාත්කරුවන්, ප්‍රජාපාදක සංවිධාන, උපදේශක ආයතනයන් සහ විදේශීය සැපයුම්කරුවන්ගේ අනුමත නියෝජිතවරුන් වෙතින් වෙළඳපල මිල සැඳැහුම් (Shopping Bidding Method) යටතේ අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **අයදුම්පත්/උපදෙස් හා කොන්දේසි**

අ. අයදුම්කරුවන්ට, **2024.10.01** දින සිට **2024.10.31** දින දක්වා කාලය තුල පහත සඳහන්"වෙබ්" අඩවියට පිවිස එහි ***"Procurement Notices"***හරහා ලියාපදිංචිවීමට අවශ්‍ය අයදුම්පත් සහ ඊට අදාළ ලියකියවිලි අයකිරීමකින් තොරව ලබාගත හැක(**Download**).

**නාගරික සංවර්ධන අධිකාරිය - www.uda.gov.lk**

ආ. ලියාපදිංචිවීමට අදාළ අයදුම්පත සහ ලියකියවිලි කට්ටලය පහත සඳහන් කොටස් වලින් සමන්විතවේ.

- i. ප්‍රධාන අයදුම් පත්‍රය
- ii. උපදෙස් සහ කොන්දේසි අඩංගු පත්‍රිකාව
- iii. අයිතම ලැයිස්තුව (ඉංග්‍රීසි බසින්)

ඉහත සඳහන් ලියකියවිලි "වෙබ්" අඩවිය හරහා ලබා ගැනීම පිළිබඳ අයදුම්කරුවෙකුට යම්කිසි ගැටළු සහගත තත්වයක් පැනනැගුණහොත් නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයේ පහත සඳහන් නිලධාරී අමතන්න.(කාර්යාල වේලාවන් තුල පමණි)

- ❖ **සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - නාගරික සංවර්ධන අධිකාරිය**

  **සෘජු දුරකථන අංක – 011 3049008**

| | | | |
|---|---|---|---|
| **011 2875916-20** | **011 2873651-2** | **011 2873644** | |
| **011 2873649** | **011 2875333** | **011 2797200** | **දිගුව - 2681** |

- ❖ **සහකාර අධ්‍යක්ෂ (මුදල්) - නාගරික සංවර්ධන අධිකාරිය - දිගුව - 2683**

3. **ලියාපදිංචිය සඳහා අයිතම ගාස්තු ගෙවීම**

අ. **එක් අයිතමයක් සඳහා ලියාපදිංචිවීමේ ගාස්තුව ලෙස රු. 1,200.00 මුදලක් අයකරනු ලැබේ. (2.5% (සමාජ ආරක්ෂන බද්ධ) සහ 18% (එකතු කල අගය මත බද්ධ)ඇතුළුව)**

ආ. **2025** වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම සඳහා අයිතම ගාස්තු, ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක **1534** දරණ ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට හෝ නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය, පළාත්/දිස්ත්‍රික් කාර්යාලයන්ට ගෙවිය හැක.

ඇ. අයිතම ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන මුදල් තැන්පතු පත්‍රිකාව/කුවිතාන්සියේ මුල් පිටපත, අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කලයුතුය.

ඇ. අයදුම්කරුවන් විසින් **2024.11.30** දිනට හෝ ඊට ප්‍රථම අයිතම ගාස්තු ගෙවා අවසන් කල යුතුය. **2024.11.30** දිනට පසුව ගෙවනු ලබන අයිතම ගාස්තු පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය වගකියනු නොලැබේ.

**4.** නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලිපිලේඛණ සමග **2024.11.30** දිනට හෝ ඊටප්‍රථම ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් බාරදිය යුතුය. ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම-**2025** වර්ෂය"යනුවෙන් සඳහන් කලයුතුය.

සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය,
ප්‍රසම්පාදන ඒකකය,
7 වනමහල,
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

**5.** **2025** වර්ෂයට, නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

**6.** අවම වශයෙන් දින **30** ණය කාලයක් ලබා දෙනු ලබන ලියාපදිංචි සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය
ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස
හා ඉදිකිරීම් අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය
ප්‍රසම්පාදන ඒකකය,
7 වන මහල
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

2024 ඔක්තෝබර් මස 01 වන දින